**සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගම - 2016/2017**

---

සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා (පෞද්ගලික) සමාගමේ ("සමාගම") 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශානයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදුකරන ලද මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---

(අ) මුළු වටිනාකම රු. 206,361,134 ක් වූ ගෙවිය යුතු ගිණුම්, ලැබිය යුතු ගිණුම් හා වියදම් සඳහා අවශ්‍යවන සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

(ඇ) 2017 මාර්තු 31 දිනට මුදල් පොතේ බැංකු ශේෂය හා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව ශේෂය අතර රු. 56,417 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, වෙනසට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ) සඳහා සමාගමේ දායකත්වය, අයවැය දීමනා, ජීවන වියදම් දීමනා සහ මාසික දීමනා රු. 2,613,391 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර සේවක භාරකාර අරමුදල (සේ.භා.අ) සඳහා දායකත්වය සහ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩල වැටුප් රු. 917,583 කින් අඩුවෙන් දක්වා තිබුණි. එම නිසා සේවක පිරිවැය හා සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 1,695,808 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) එකතුව රු. 4,548,227 ක් වූ ණයගැති ශේෂය වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතු නොකිරීම විගණනයේදී මතභේදයට තුඩුදුනි.

(ඊ) ශ්‍රී.ල.ගි.ප්‍ර. 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, අනුව මූල්‍ය ප්‍රකාශන වල වත්කම් හා වගකීම් වෙන් වෙන්ව වාර්තා කළ යුතු අතර එකිනෙක හිලව් කිරීම නොකළ යුතුය. නමුත් එකතුව රු. 912,041 ක් වූ ලැබිය යුතු සනීපාරක්ෂක ශේෂය හා එකතුව රු. 71,225 ක් වූ සනීපාරක්ෂක

ණයහිමි ශේෂය එකිනෙක හිලව් කර ශුද්ධ වටිනාකම වූ රු. 840,816 මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ගිණුම් ලෙස සටහන් කර තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය ව්‍යාවනය

------------------

මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

#### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තිය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි:

(අ) මතය සඳහා පදනම, විෂය පථය හා සීමා කිරීම් ඉහත පරිදි වේ.

(ආ) මාගේ මතය වන්නේ:

විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර එබැවින්, මම මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 සමාගම සංස්ථාගත කිරීම

------------------------------------

සමාගම පිහිටුවීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව සමාගමේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදය භාණ්ඩාගාරය මගින් අනුමත කරගෙන නොතිබුණි.

### 2.4 අඛණ්ඩ පැවැත්ම

-------------------

මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාගමේ ලාභයෙන් සියයට 85.33 ක් ලංකා සතොසින් ජනනය වන අතර සමාගම සහ ලංකා සතොස අතර කිසිඳු සේවා ගිවිසුමක් නොතිබුණි. එය සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපෑ හැකිය.

## 3 මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 4,981,312 ක බදු පසු ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී බදු පසු ශුද්ධ ලාභය

රු. 2,676,179 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,305,133 ක වර්ධනයක් සමාලෝචිත වර්ෂයේ පෙන්නුම් කෙරුණි. ආදායම රු. 26,592,020 කින් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම්කරණය

**(අ) සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම 2011 වර්ෂයේ සිට පිළියෙල කර නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි.

### 5.2 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් විගණන කමිටුවක් ස්ථාපනය කර නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | භාණ්ඩ සමීක්ෂණය/වත්කම් සත්‍යාපනය සිදුකිරීමට අපොහොසත් වීම. |
| (ආ) ගිණුම්කරණය | ලෙජර් ගිණුම් ශේෂ ආධාරක ලියවිලි සමඟ සාධාරණීකරණය කල නොහැකි වීම. |

| | | |
|---|---|---|
| (ඇ)සේවක මණ්ඩල කළමණාකරනය | (i) | කාර්ය මණ්ඩලය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට අපොහොසත් වීම. |
| | (ii) | බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදයක් නොමැතිවීම . |